**ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුව**

**-------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

නීතිපති දෙපාර්තමේන්තුවේ2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීතිපතිදෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරවදෙපාර්තමේන්තුවටඅදාළවාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකසමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවපාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑමහැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නීතිපතිදෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින්කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 ආදායම් ලැබීම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂයේ අවසාන හිඟ ආදායම් ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ ආදායම් ශේෂය අතර රු.6,665,211 ක වෙනසක් පැවතුණි. | ගිණුම් නැවත පරීක්ෂා කිරීමේදී හෙලි වූ පරිදි අතපසු වීමකින් බිල්පත් වර්ෂ අතර මාරු වී ගිණුම් ගත වී තිබීම නිවැරදි කිරීම මෙම වෙනසට හේතු වී ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂ නිවැරදිව දැක්විය යුතුවේ. |
| (ආ) හිඟ ආදායම් ශේෂයේමූල්‍ය ප්‍රකාශනය හා උපලේඛනය අතර රු.45,000 ක වෙනසක් පැවතුණි. | පළාත් පාලන ආයතනයක් විසින් ගෙවා තිබූ රු.45,000 ක බිල්පතක් අතපසුවීමකින් හිඟ ආදායමක් ලෙස සටහන් වී ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව සකස් කළ යුතුවේ. |

**1.6.2 පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 65(1) ප්‍රකාරව වැය විෂයයන්වලට අයත් වියදම් අදාල වැය විෂයයන් වලටම ගිණුම්ගත කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේදී මාරු පත්‍ර මඟින් සිදුකළගැළපීම්වලින් පසු අදාල වැය විෂයයන්ට අදාල නොවන රු.13,225,523 ක් අවස්ථා 25 කදී වෙනත් වැය විෂයන්ට ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයේදී අතුරු සම්මත ගිණුම් 03 ක් මගින් හා දෙසැම්බර් මස ඉදිරිපත් කරන ලද අයවැය මගින් 2020 වර්ෂය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරනු ලැබීය. දෙවැනි හා තුන්වන අතුරු සම්මත ගිණුම් මගින් සමහර පුනරාවර්තන වැය විෂයන් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන එකී කාල සීමාව සඳහා ප්‍රමාණවත් නොවූ අවස්ථාවන්හි දී ඉදිරි අතුරු සම්මතගිණුම් මගින් ප්‍රතිපාදන සපයා ගන්නා තෙක් ප්‍රතිපාදන ඉතිරිව පැවති වෙනත් පුනරාවර්තන වැය විෂයන්ට හර කර ගෙවීම් සිදු කරන ලදී.<br>හතරවන කාර්තුව සඳහා අදාල වැය විෂයන්ට ප්‍රතිපාදන සපයා ගැනීමෙන් පසු මාරුපත්‍ර 19 ක් මගින් අදාල ගිණුම්ගත කිරීම් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බැවින් ඔබගේ විගණන විමසුමෙහි සඳහන් පරිදි වැය විෂයන්ට සාවද්‍ය හර කිරීම් සිදු වී නොමැති බව දන්වමි.<br><br>තවද නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන්ට හිමි ගමන් වියදම් දීමනා ගිණුම්ගත කෙරෙනුයේ 1401 ප්‍රවාහන සේවා වැය විෂය යටතේ වේ. විගණන විමසුමෙහි සඳහන් 1401 වැය විෂය යටතේ ගිණුම් කර ඇති වියදම් පිට පළාත් රාජකාරි සඳහා යන නීති නිලධාරීන්ට ගෙවනු ලබන ගමන් වියදම් දීමනා බවද දන්වමි. | ඒ ඒ වැය විෂයන්වලට අයත් වියදම් අදාල වැය විෂයන්වලටම ගිණුම්ගත කළ යුතුවේ. |

## 1.6.3 මූලධනවියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.51,954,296 ක් වුවදමූලා නොවන වත්කම් ප්‍රකාශයේ රු.51,862,796 ක් ලෙස රු.91,500 කින් වැඩියෙන් දක්වා තිබුණි. | අදාල වත්කම් මිලදී ගැනීම සඳහා දරන ලද වියදම සිගාස් පරිගණක වැඩසටහනෙහි මූලා නොවන වත්කම් ප්‍රකාශයට ඇතුලත් කිරීම මඟ හැරී ඇති අතර එය නිවැරදි කර මූලා නොවන වත්කම් ප්‍රකාශය යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට කටයුතු කරන බව දන්වමි. | වත්කම් අත්පත් කර ගැනීම් නිවැරදිව මූලා ප්‍රකාශනවල දැක්විය යුතුවේ. |
| (ආ) | මූලානොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ශේෂයන් සහ භාණ්ඩාගාරයේ මූලා නොවන වත්කම් ගිණුම් අතර රු.11,201,818 ක වෙනසක් පැවතුණි. | අදාල වත්කම් සිගාස් පරිගණක වැඩසටහනට ඇතුළත් කිරීමේදී සිදු වී ඇති දෝෂයන් මෙම වෙනස්වීම් වලට හේතු වී ඇත. | දෙපාර්තමේන්තු ගිණුම් භාණ්ඩාගාරයේ ගිණුම් සමඟ සැසඳී තිබිය යුතුවේ. |
| (ඇ) | මූලධන වියදම් ප්‍රතිපාදන වලින් රු.600,394 ක පුනරාවර්තන වියදම් සිදුකර තිබුණි. | විගණන විමසුමෙහි සඳහන් අදාල වියදම් වවුනියා හා මන්නාරම නීතිඥ නිල නිවාස ඉදිකිරීමේ පරිපාලන වියදම් වන අතර එකී පරිපාලන වියදම් අදාල ව්‍යාපෘතීන්හි ඇස්තමේන්තුවල ඇතුළත් වී ඇති වියදම් වේ. | වියදම් නියමිත වැය විෂයන්වලට ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | මූලා ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ 38 කට වූ අනතුරු ඇතුලත් කර නොතිබු අතර ඉන් අනතුරු 29 ක තක්සේරු අලාභය රු.1,146,964 ක් විය. | දෙපාර්තමේන්තුවට අයත් වාහනවල සිදුවන සියළුම හදිසි අනතුරු හදිසි අනතුරු ලේඛනයට ඇතුළත් කරනු ලබන අතර හානි හා පාඩු ලේඛනයට මෙතෙක් ඇතුළත් කර ඇත්තේ අනතුරට අදාල චෙක්පත, නීතිපතිතුමා නමින් නිකුත් කර ඇති අවස්ථාවල පමණි. මින් ඉදිරියට සියළු අනතුරු සම්බන්ධ විස්තර හානි හා පාඩු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයේ සිදුවන මෝටර් රථ අනතුරු අලාභයන් මූලා ප්‍රකාශනවලදැක්විය යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ආදායම් අයකර ගැනීම** | | |
| ඉකුත් වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල හිඟ හිටි ආදායම වූ රු.223,535,446 න් සමාලෝචිත වර්ෂයේ දී රු.37,279,838 ක් අයකර තිබුණදවර්ෂය අවසානයට සමස්ථ ශේෂය රු.308,831,925 ක් විය. | නීතිපති දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට ඔවුන්ගේ ඉල්ලීම අනුව නීතිමය උපදෙස් සැපයීම හා අධිකරණවල පෙනී සිටීම වෙනුවෙන් එම ආයතන වලින් කරනු ලබන අය කිරීම් නීතිපතිතුමාගේ ආදායම් ගිණුමට බැර කරනු ලබයි. අදාල බිල්පත් එම ආයතන වෙත නියමිත පරිදි යොමු කරනු ලැබුවද, ගෙවීම් සිදු කිරීම ප්‍රමාද වන නමුත් ඒවා රජයේ ආයතන වන බැවින් අවශ්‍ය නීතිමය කටයුතු අඛණ්ඩව සිදු කරනු ලබන අතර ගාස්තු අය කර ගැනීම කඩිනම් කිරීම සඳහා වරින්වර සිහි කැඳවීම් සිදු කෙරේ. | රජයට අයවිය යුතු ආදායම් කාල පමාවකින් තොරව අය කර ගැනීමටඅවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| **(ආ) ආදායම් තත්ත්වයන් කලින් කලට සමාලෝචනය නොකිරීම** | | |
| 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාර පවතින ආර්ථික තත්ත්වයන්ගේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු එම සේවාවන් සැපයීම සඳහා වන වියදම්ද සලකා බලා කලානුරූපීව සංශෝධනය කල යුතුය. සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ බිල්කල ආදායම රු.101,349,896 ක් වූ අතර රැස්කල ආදායම රු.62,764,949 ක් විය. සමාලෝචිත වර්ෂයේදීවැය ලෙජර් අනුව ආදායම් රැස්කිරීම සඳහා ව්‍යවස්ථාපිත වියදම් නොමැතිවරු.85,518,640 ක් දරා තිබුණුබැවින් එමඟින් රජයට මූල්‍ය වාසියක් සිදු වී තිබේද යන්න ගැටළු සහගත විය. | සංස්ථා අංශයයේ උපයන ලද ආදායම, එම අංශයේ වියදම ඉක්මවා ඇති බැවින් මූල්‍ය පාඩුවක් සිදු වී නොමැත. | සංස්ථා අංශයේ තථ්‍ය වියදමනිවැරදිව හඳුනාගත යුතුවේ. |

## 2.2 වියදම් කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක 50 ප්‍රකාරව, ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මූලධන වැය විෂයයක රු.23,000,000 ක ප්‍රතිපාදන වෙනත් මූලධන වැය විෂයයකට මාරු කර තිබුණි. | ඉදි කිරීම් අවසන් කර තිබූ නීතිපති දෙපාර්තමේන්තු නව ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය ලී බඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු රට තුළ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් සිදු කල නොහැකි වූ බැවින් ඒ සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ඉතිරි වීමක් සිදු විය. ඒ අතර අනුරාධපුරය හා වවුනියාව රජයේ අධිනීතිඥ නිල නිවාසයන්හි ඇති වූ හදිසි අත්‍යවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලැබූ රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවීම් කිරීම සඳහා ඉහත ඉතිරි ප්‍රතිපාදන වලින් කොටසක් මාරු කර ගනු ලැබීය. | තාත්විකව හා නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතුවේ. |
| (ආ) | ා 19 වසංගත තත්ත්වය නිසා සමාලෝචිත වර්ෂයේ වැඩි කාලයක් කාර්යාල වසා තැබීම සහ අවම සේවක ධාරිතාවයකින් වැඩ කර තිබුණද පුනරාවර්තන වැය විෂයන් 09 ක් සඳහා සලසා තිබූ සියලු ප්‍රතිපාදන අවසන් වී තිබුණි. මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා සලසා තිබූ ප්‍රතිපාදන වලින් සියයට 21 සිට සියයට 91 ක් දක්වා පරාසයක් තුළ ඉතිරිවීම් සිදුවී තිබුණි. | රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව අධිකරණමය කටයුතු කඩිනම් කිරීමේ අරමුණින් නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී පුරප්පාඩු පිරවීම සඳහා 2020 වර්ෂය තුළකටයුතු කරන ලදි. නීති නිලධාරීන්ට ඉන්ධන, ගමන් වියදම්, ලිපි ද්‍රව්‍ය ඇතුළුඅනෙකුත් දීමනා ගෙවීමට අවශ්‍ය වන වියදම් හා අනෙකුත් පුනරාවර්තන වියදම් වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී සැලකිල්ලට ගනු ලැබුවද, භාණ්ඩාගාරය විසින් එකී ප්‍රතිපාදන 2020 දෙසැම්බර් මස සකස් කරන ලද අවසන් අයවැය ඇස්තමේන්තුවට ඇතළත් නොකිරීම හේතුවෙන් පැවති ප්‍රතිපාදන ඌණතාවයන්, කාර්යාල වසා තැබීම නිසා අනුමත ප්‍රතිපාදන තුළින් කළමනාකරණය කර ගත හැකි වූ අතර ප්‍රතිපාදන ඉතිරි වීමක් සිදු නොවීය.<br>ඉදිකිරීම් අවසන් කර තිබූ නීතිපති | විචක්ෂණශීලී භාවයෙන් වියදම් කළමනාකරණය කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| | දෙපාර්තමේන්තු නව ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය ලී බඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු රට තුළ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් සිදු කල නොහැකි වූ බැවින් ඒ සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ඉතිරි වීමක් සිදු විය. | |

**2.3** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2019 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාරයට වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක් 2021 වර්ෂයේ දී නිරවුල් නොකළ යුතු වුවත්, භාණ්ඩාගාරයට වාර්තා නොකරන ලද රු.3,604,295 ක බැරකම් සඳහා 2021 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. | බැරකම් ලෙස රු.38,650,385 ක් පමණක් භාණ්ඩාගාරයට වාර්තා කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) ල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 03 ක ප්‍රතිපාදන ඉක්මවා රු.3,404,730 ක බැරකම් වලට එළඹ තිබුණි. | දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය වූ පුනරාවර්තන වියදම් වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී සැලකිල්ලට ගනු ලැබුවද, භාණ්ඩාගාරය විසින් එකී ප්‍රතිපාදන 2020 දෙසැම්බර් මස සකස් කරන ලද අවසන් අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඌණතාවයක් ඇති වූ බැවින් අදාල බැරකම් වලට එළඹීමට සිදු විය. | මුදල් රෙගුලාසිප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථානිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) මුදල්රෙගුලාසි 104(1) අ | සමාලෝචිත වර්ෂයට අදාල මෝටර් රථ අනතුරු 38 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් හෝ පවත්වා නොතිබුණි | අනතුරට පත්වීම හේතුවෙන් පාඩුවක් හෝ අලාභයක් සිදුවූ සෑම විටම මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පැවැත්වීමක් සිදු කරනු නොලබන අතර, අනතුර හේතුවෙන් සිදු කළයුතු අළුත්වැඩියා වියදම සම්පූර්ණයෙන් රක්ෂණයෙන් අයකර ගැනීමට නොහැකි වන අවස්ථාවලදී පමණක් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පැවැත්වීම සිදු කරනු ලබයි. | මුදල් රෙගුලාසිප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) මුදල්රෙගුලාසි 880(1) | දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් 04 දෙනෙකුගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පත් කිරීමේ කටයුතු ක්‍රියාත්මකකිරීමට අවශ්‍ය උපදෙස් අමාත්‍යාංශයෙන් ඉල්ලා යවා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කෙරෙමින් පවතින අතර කෝවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් වාර්තාව සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇති අතර කඩිනමින් එය සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කරන බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුවේ. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රජය රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිතමණ්ඩල සඳහා අවශ්‍ය සියළුම නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේදී සුවිශේෂී කාර්යන් සඳහා දායක වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 271 ක් එනම් සියයට 54 ක පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම දෙපාර්තමේන්තු කාර්යසාධනය කෙරෙහි ඍජුවම බලපෑමක් ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය. | නීති නිලධාරීන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ අවසක් කර ඇති අතර රට තුළ පවතින කෝවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් බඳවා ගැනීමේ කටයුතු ප්‍රමාද වී ඇත. | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යන් ඵලදායීව ඉටු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලට අදාල කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම ප්‍රමුඛ කාර්යන් ලෙස සලකා කටයුතු කළ යුතුවේ. |